සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) අතීත ප්‍රජාව විසින් විවිධ කාල වකවානුවල දී ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන හඳුන්වනු ලබන්නේ,
(1) ඓතිහාසික ග්‍රන්ථ නමිනි. (2) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය නමිනි.
(3) සාහිත්‍ය මූලාශ්‍රය නමිනි. (4) සංදේශ කාව්‍ය නමිනි.

(02) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශය වන්නේ,
(1) තෙත් කලාපීය බොරළු මිශ්‍ර පස් තට්ටුවයි.
(2) අර්ධ ශුෂ්ක කලාපයේ මැටි හා බොරළු තට්ටුවයි.
(3) වෙරළ බඩ ලුණු මිශ්‍ර වැලි පස් ප්‍රදේශයයි.
(4) කඳුකර වියළි කලාපයයි.

(03) සකපෝරුව භාවිත කරමින් සකස් කරන ලද වළඳක කොටසක් හමුවී ඇති ස්ථානය කුමක් ද?
(1) හල්දුම්මුල්ල (2) වැල්ලෙගංගොඩ (3) පාහියන්ගල (4) හෝර්ටන් තැන්න

(04) විමධ්‍යගතව පැවති දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ව්‍යාපාරයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ,
(1) දේවානම්පියතිස්ස රජු ය. (2) වසභ රජු ය.
(3) ධාතුසේන රජු ය. (4) දුටුගැමුණු රජු ය.

(05) විවිධ රාජ්‍යත්ව සංකල්ප තුළින් රජුගේ උසස් බව පෙන්වා ජනතාව රජුගෙන් බලාපොරොත්තු වූයේ,
(1) දක්ෂ රණකාමී පාලකයෙකු වීමයි. (2) දැහැමිව පාලනය ගෙන යාමයි.
(3) රාජ්‍යය විශාල කර ගැනීමයි. (4) ආදර්ශවත් ලෙස පාලනය ගෙනයාමයි.

(06) අන්තර් ජාතික කලාපීය අවශ්‍යතාවකට මුහුණ දෙමින් දුරදක්නා නුවණින් යුතුව කටයුතු කළ රජෙකු වන්නේ මින් කවරෙක් ද?
(1) දුටුගැමුණු රජු (2) වසභ රජු
(3) ධාතුසේන රජු (4) මහසෙන් රජු

(07) හයවන අග්ගබෝධි රජු හා සම්බන්ධ සිදුවීමක් සඳහන් පිළිතුර තෝරන්න.

(1) අරාබි රටවල් සමඟ සුහද සබඳතා ගොඩනැගීම

(2) දළදා මාලිගාවේ ආරක්ෂාවට වේලක්කාර හමුදාව යෙදවීම

(3) රෝමානු දේශයට තානාපතිවරුන් යැවීම

(4) චීනය සමඟ රාජතාන්ත්‍රික දූත ගමන් වැඩි ප්‍රමාණයක් සිදුකිරීම

(08) හේන්වලින් අය කරන ලද කැතිඅඩ හා කෙටු කනබ යන බදු වර්ග දෙක අහෝසි කළ බව සෙල්ලිපිවල සඳහන් කර ඇත්තේ කුමන රජතුමා ද?

(1) නිශ්ශංකමල්ල රජු (2) I පරාක්‍රමබාහු රජු

(3) වසභ රජු (4) ධාතුසේන රජු

(09) සෙල්ලිපිවල වොහාර, ලපන, වාපර, වෙජ වශයෙන් දක්වා ඇති පුද්ගලයින් හැඳින්වෙන නම් අනුපිළිවෙළින් සඳහන් වන පිළිතුර තෝරන්න.

(1) වෛද්‍යවරුන්, වෙළෙන්දන්, චිත්‍ර ශිල්පීන්, නීති විශාරදයන්

(2) නීති විශාරදයන්, චිත්‍ර ශිල්පීන්, වෙළෙන්දන්, වෛද්‍යවරුන්

(3) චිත්‍ර ශිල්පීන්, වෙළෙන්දන්, නීති විශාරදයන්, වෛද්‍යවරුන්

(4) නීති විශාරදයන්, වෙළෙන්දන්, වෛද්‍යවරුන්, චිත්‍ර ශිල්පීන්

(10) විශාල වැව්වල ජලය බැම්මට හානියක් නොවී පිටතට ගැනීම සඳහා පැරණි වාරි ශිල්පීන් යොදාගන්නා ලද තාක්ෂණික අංගය වූයේ,

(1) පිටවාන ය (2) දියකැට පහණ ය (3) සොරොව්ව ය (4) රළපනාව ය.

(11) වෙඬරුමැටි, බොරලු තට්ටු, පළිඟු ගල්, රත්සිරියල් ගල්, නවනීත මැටි ආදිය අතීතයේ භාවිතා කිරීම තුළින් හෙළිවන්නේ,

(1) පොළවේ විවිධ ගල් හා මැටි වර්ග පැවති බව ය.

(2) වැව් බැම්ම තට්ටු වශයෙන් සකස් කළ බව ය.

(3) නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේද භාවිතා කළ බව ය.

(4) විවිධ ගල් හා මැටි තට්ටු වශයෙන් පොළවේ පැවති බව ය.

(12) ස්ථිතික ජල විද්‍යා මූලධර්මය පිළිබඳ දැනුම පැරණි ශිල්පීන් තුළ පැවති බවට ඉදිරිපත් කළ හැකි නිර්මාණය කුමක් ද?

(1) රුවන්මැලි සෑයේ වජ්‍ර චුම්බට ය. (2) දැදිගම ඇත් පහන

(3) සීගිරියේ ජලමල් (4) සොරොව්වේ දියකැට පහණ

(13) පැරණි කාලයේ කෙටි දුර මැනීම සඳහා භාවිතා කළ වියත වර්තමානයේ සමාන කළ හැක්කේ කුමන ප්‍රමාණයකට ද?

(1) අඟල් 4ට ය. (2) අඩි 9ට ය. (3) අඟල් 9ට ය. (4) අඟල් 6ට ය.

(14) අතීත සමාජ සංවිධානය තුළ නිෂ්පාදනය භුක්ති විඳි පුද්ගලයින් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) වෙළෙන්දන්, ගොවියන්, ලෝකුරුවන්, කුඩීන්

(2) එඬේරුන්, කුඹකරයින්, ලෝකුරුවන්, වෛද්‍යවරුන්

(3) මහමත, වෛද්‍යවරු, බඩගරික, වෙළෙන්දන්

(4) නාවික කප්පිත්තන්, වෛද්‍යවරු, ගුරුවරු, බඩගරික

(15) මහාධිකරණයක් පිළිබඳ සඳහන්වන සිතුල්පව්ව සෙල්ලිපිය කරවන ලද්දේ කුමන රජු විසින් ද?

(1) පළමුවන සේන (2) දෙවන සේන
(3) පළමුවන ගජබාහු (4) දෙවන ගජබාහු

(16) පහත දැක්වෙන තොරතුරුවලට අදාළ රජවරුන් දෙදෙනාගේ නම් සඳහන් පිළිතුර තෝරන්න.

- චන්ද්‍රභානු ජාවකගේ ආක්‍රමණයන්ට මුහුණ දීම
- දේව පතිරාජ ඇමතිවරයා යොදවා ආර්ථික හා ආගමික සංවර්ධනය සිදු කිරීම
- ඊජිප්තුවේ සුල්තාන් වෙත තානාපතිවරු පිරිසක් යැවීම
- කාලිංගරායරගේ ආක්‍රමණයන්ට සාර්ථකව මුහුණ දීම

(1) තුන්වන පරාක්‍රමබාහු රජු හා දෙවන බුවනෙකබාහු රජු
(2) දෙවන පරාක්‍රමබාහු රජු හා පළමුවන බුවනෙකබාහු රජු
(3) දෙවන පරාක්‍රමබාහු රජු හා දෙවන බුවනෙකබාහු රජු
(4) තුන්වන විජයබාහු රජු හා තුන්වන පරාක්‍රමබාහු රජු

(17) දැදිගම සෙල්ලිපියෙන් දැක්වෙන්නේ පහත සඳහන් කුමන තොරතුර පිළිබඳව ද?

(1) පළමුවන පරාක්‍රමබාහු රජුගේ උපත පිළිබඳව
(2) චෙංහෝ සෙනෙවියා වීර අලකේශ්වර රැගෙනයාම පිළිබඳව
(3) ගම්පොළ සේනාධිලංකාර සෙනෙවිරත් පවුල පිළිබඳව
(4) සිංහල සංඝෙ කැරලි නායකයින්ට සමාව දීම පිළිබඳව

(18) ගන්නොරුව සටන මෙහෙයවූ සිංහල රජු හා පෘතුගීසි කපිතාන්වරයා අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) දෙවන රාජසිංහ - දියෝගු ද මේලෝ කස්ත්‍රෝ
(2) පළමුවන විමලධර්මසූරිය - ජොරනිමෝ ද අසවේදු
(3) පළමුවන රාජසිංහ - කොන්ස්තන්තීනු ද සා
(4) දෙවන විමලධර්මසූරිය - පේරෝ ලොපෙස් ද සූසා

(19) මහනුවර රාජධානි සමයේ පැවති අර්ථක්‍රමය හා නොගැළපෙන පිළිතුර කුමක් ද?

(1) කිරි ලබා ගැනීම සඳහා සත්ව පාලනය සිදුවිය.
(2) සුළු කර්මාන්ත රාශියක් පැවතිනි.
(3) ස්වයං පෝෂිත ආර්ථික රටාවක් විය.
(4) වී වගාව මහා පරිමාණ වශයෙන් සිදුවිය.

(20) මහනුවර රාජධානියේ පාලනය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් "අ" සහ "ආ" තීරු දෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. රටවසම | A. කටුපුල්ලේ |
| 2. රාජ සභාව | B. මහගබඩා නිලමේ |
| 3. මහවාසල | C. මහ දිසාවේ |
| 4. විහාර දේපොල | D. අදිකාරම්වරු |
| | E. දියවඩන නිලමේ |

(1) A D C B (2) C D B E (3) A D B E (4) C B E D

(21) ලන්දේසීන් හා උඩරට රජු අතර එලදායී සබඳතා ආරම්භ වූයේ,
(1) පළමුවන විමලධර්මසූරිය රජුගේ කාලයේ දී ය.
(2) දෙවන විමලධර්මසූරිය රජුගේ කාලයේදී ය.
(3) දෙවන රාජසිංහ රජුගේ කාලයේදී ය.
(4) සෙනරත් රජුගේ කාලයේදී ය.

(22) ද්විත්ව පාලනය අසාර්ථක වීමත් සමඟ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ ප්‍රධානම වෙනස්කම කුමක් ද?
(1) මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලනය අහෝසිවීම
(2) අවුමිල්දාර්වරු ආපසු යැවීම
(3) උඩරට රාජධානිය ආක්‍රමණය කිරීම
(4) බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම

(23) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු තම රාජධානිය තුළම අනාරක්ෂිතයෙකු බවට පත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?
(1) රජු භික්ෂු ඝාතන සිදු කිරීම
(2) ප්‍රභූ පන්තිය හා මහජනතාව රජුට එරෙහි වීම
(3) රජු සුරාලෝලියෙකු වීම.
(4) ප්‍රභූ පන්තිය ඉංග්‍රීසීන්ට උදව් කිරීම.

(24) ක්‍රි.ව. 1848 දී සිදුවූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ කුමන ප්‍රදේශය ද?
(1) කුරුණෑගල
(2) මහනුවර
(3) මාතලේ
(4) වෙල්ලස්ස

(25) - අනගාරික ධර්මපාලතුමා
- වලිසිංහ හරිස්චන්ද්‍රතුමා
- පියදාස සිරිසේන මහතා
- ජෝන් ද සිල්වා මහතා

පුනරුද ව්‍යාපාරයේ දී ඉහත සඳහන් පුද්ගලයන් ක්‍රියා කළ ආකාරය පිළිබඳ දිය හැකි පොදු නිගමනය කුමක් ද?
(1) බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
(2) දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරිම
(3) නාට්‍ය මගින් ජනතාව තුළ දේශනුරාගය ඇති කිරීම
(4) බෞද්ධ පොත් පත් රචනා කිරීම තුළින් ආගමික නැඹුරුවක් ඇති කිරීම

(26) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීමේ පුරෝගාමියා වූයේ,
(1) ටී.බී.ජයා මහතා ය.
(2) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
(2) අරුමුගනාවලර් තුමා ය.
(4) සිද්දි ලෙබ්බේ මහතා ය.

(27) පහත අ සහ ආ යටතේ දක්වා ඇති ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා යෝජනා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ | A. සර්ව ජන ඡන්දබලය ලැබීම |
| 2. මැනිං ප්‍රතිසංස්කරණ | B. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව |
| 3. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ | C. පළාත්බද නියෝජනය හඳුන්වා දීම |
| 4. සෝල්බරි ප්‍රතිසංස්කරණ | D. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම |

(1) DACB
(2) BACD
(3) DCAB
(4) CDBA

(28) ක්‍රි.ව. 1935 දී ලංකා සමසමාජ පක්ෂය පිහිටුවා එහි නායකත්වයට පත්වූයේ,

(1) කොල්වින් ආර් ද සිල්වා මහතා ය. (2) එන්.එම්.පෙරේරා මහතා ය.

(3) එස්.ඒ.වික්‍රමසිංහ මහතා ය. (4) ඒ.ඊ.ගුණසිංහ මහතා ය.

(29) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත්කරගන්නා විට පැවති සමාජ ආර්ථික ක්‍රමය පිළිබඳ විස්තරවන වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ප්‍රභූ පන්තිය පරිපාලන කටයුතු මෙහෙය වූ අතර සාමාන්‍ය ජනතාව කෘෂිකර්මාන්තයේ නිරතවිනි.

(2) සමාජයේ අති බහුතරය හිමිවූයේ ප්‍රභූ පන්තියට ය.

(3) ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වූයේ මුහුදුබඩ ප්‍රදේශවල පමණි.

(4) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යටතේ සියලුම ජනයා නියමිත දින ගණනක් රජුට සේවය සැපයිය යුතු වේ.

(30) රබර් වගාව ආරම්භ වූ කාලයේ දී වැඩි වශයෙන් වගා කළ දිස්ත්‍රික්කය කුමක් ද?

(1) කළුතර (2) කෑගල්ල (3) රත්නපුරය (4) මහනුවර

(31) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ විස්තර වන්නේ කුමන කොටසෙහි ද?

(1) 18 වන වගන්තියේ ය. (2) තුන්වන පරිච්ඡේදයේ ය.

(3) 129වන වගන්තියේ ය. (4) හතරවන පරිච්ඡේදයේ ය.

(32) ශ්‍රී ලංකාවේ ආරම්භ කළ ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය කුමක් ද?

(1) ගල්ඔය යෝජනා ක්‍රමය (2) මහවැලි යෝජනා ක්‍රමය

(3) ඉඟිනිමිටිය යෝජනා ක්‍රමය (4) ලුණුගම්වෙහෙර යෝජනා ක්‍රමය

(33) පුනරුද සමයේ බිහිවූ සාහිත්‍ය ග්‍රන්ථ හා කලා නිර්මාණ "අ" තීරුවේ ද නිර්මාණකරුවෝ "ආ" තීරුවේ ද දැක්වේ. තීරු දෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. මොනාලිසා | A. පෙට්රාක් |
| 2. පියෙටා ප්‍රතිමාව | B. බොකැෂියෝ |
| 3. ලෝරාට සැහැලිකවි | C. ලියනාඩෝ ඩාවින්චි |
| 4. ඩිවිනා කොමඩියා | D. අලගියරි ඩාන්ටේ |
| | E. මයිකල් ආන්ජිලෝ |

(1) CEAD (2) CBAD (3) ADCB (4) DECB

(34) පුනරුදයත් සමඟ කලාශිල්පවල ඇතිවූ ප්‍රධාන වෙනස්කමක් පෙන්වන පිළිතුර තෝරන්න.

(1) කලා නිර්මාණ ශ්‍රේණි වශයෙන් ඉදිරිපත්වීම

(2) කලා ශිල්පවල ආගමික නැඹුරුවක් පැවතීම

(3) පල්ලිය කලාකරුවන්ට අනුග්‍රහය දැක්වීම

(4) කලාකරුවන්ගේ දක්ෂතා ස්වාධීනව ඉස්මතු වීම

❖ පහත වගුවේ A සිට I දක්වා තොරතුරු ඇසුරින් 35 - 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| පුද්ගලයා | නිපැයුම | කර්මාන්තය |
|---|---|---|
| A. හම්ප්‍රි ඩේවි | D. ආරක්ෂක ලාම්පුව | G. පේෂ |
| B. හෙන්රි කෝට් | E. මියුල් යන්ත්‍රය | H. ගල් අඟුරු |
| C. සැමුවෙල් ක්‍රොම්ප්ටන් | F. රෝලර් යන්ත්‍රය | I. යකඩ හා වානේ |

(35) පේෂ කර්මාන්තයට අදාළ නිපැයුමක් හා එය නිර්මාණය කළ පුද්ගලයා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) E හා C (2) F හා C (3) D හා B (4) D හා A

(36) හම්ප්‍රි ඩේවි විසින් කරන ලද නිර්මාණය හා එය අදාළ කර්මාන්තය දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) D හා I (2) E හා G (3) F හා H (4) D හා H

(37) පහත සඳහන් සිදුවීම් ඓතිහාසික අනුපිළිවෙළින් පෙළ ගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

A - බ්‍රිතාන්‍යයන් විසින් ජනපදවාසීන්ට මුද්දර බද්ද පැනවීම

B - වර්ජිනියා ජනපදය පිහිටුවීම

C - බොස්ටන් තේ සාදය සිදුවීම

D - ක්‍රිස්ටෝපර් කොලම්බස් බහමාස් දිවයිනට ගොඩබැසීම

(1) DBAC (2) DABC (3) CDAB (4) BCDA

(38) 1917 රුසියානු විප්ලවයේ ප්‍රධානම ප්‍රතිඵලය කුමක් ද?

(1) කෙරෙන්ස්කිගේ නායකත්වයෙන් රජයක් පිහිටුවීම

(2) බෝල්ෂෙවික්වරුන් රජයක් පිහිටුවීම

(3) සියලු කර්මාන්ශාලා ජනසතු කිරීම

(4) විශාල සමූහ ගොවිපලවල් බිහිවීම

(39) කුඩා රාජ්‍ය ගණනාවක් එකතු කොට ජර්මනිය බිහිකිරීමේ ගෞරවය හිමිවූ නායකයා වූයේ,

(1) දෙවන විලියම් කයිසර් ය. (2) ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ය.

(3) ඇඩොල්ෆ් හිට්ලර් ය. (4) ඔටෝවොන් බිස්මාර්ක් ය.

(40) රටවල් ගණනාවක් ආක්‍රමණය කරමින් ඉදිරියට ගමන් කළ හිට්ලර්ගේ පරාජය තහවුරු වූයේ කුමන රට ආක්‍රමණයෙන් පසුව ද?

(1) ප්‍රංශය (2) පෝලන්තය (3) රුසියාව (4) බෙල්ජියම

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) යාන්ඔය, ගාල්ල, මීගමුව, සීගිරිය, බූන්දල, කෝට්ටේ, ගල්ඔය ජලාශය, පරාක්‍රම සමුද්‍රය, ගම්පොළ, යෝධවැව, දඹකොළ පටුන, ත්‍රිකුණාමලය (ලකුණු 12)


(ii) මලය අර්ධද්වීපය, ඉතාලිය, රතු මුහුද, ජපානය, කැලිකට්, බ්‍රිතාන්‍යය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ලංකාවේ ප්‍රථම නාමික ජනාධිපතිවරයා
B - කෝට්ටේ බලකොටුවක් ඉදිකළ ඇමතිවරයා
C - කීර්ති කුමාරයාට රැකවරණය සැපයූ ආරක්ෂක නිලධාරියා
D - නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ පුරෝගාමියෙකු වූ යුගොස්ලෝවියානු ජනාධිපතිවරයා (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(ii) (1) A රූපයෙන් දැක්වෙන්නේ කුමන රජුගේ පිළිරුවක් ද?
(2) මෙම පිළිරුව දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයේ ද?
(3) මෙහි දැක්වෙන රජු සබඳතා පැවැත්වූ යුරෝපා රට නම් කරන්න.
(4) පූජාවක් සඳහා එරටින් ගෙන්වූ ද්‍රව්‍ය කුමක් ද?
(ලකුණු 04)



A රූපය

(iii) (1) B පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
(2) මොහු කුමන රටක පුද්ගලයෙක් ද?
(3) මොහු ඉදිරිපත් කළ දේශපාලන දර්ශනය කුමක් ද?
(4) මෙම පුද්ගලයා ආක්‍රමණය කළ අප්‍රිකානු රට කුමක් ද?
(ලකුණු 04)



B රූපය

## II කොටස

(02) (i) සිතුල්පව්ව කොරවක්ගල ප්‍රදේශයේ ගල් ගුහාවකින් තොරතුරු ලැබෙන ගම්කයින් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(ii) පරුමකවරයෙකු විසින් ඉටුකළ යුතු කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දේවානම්පියතිස්ස රජු ප්‍රාදේශීය පාලකයන් මෙන්ම විදේශීය පාලකයින් සමඟ ද සුහද සබඳතාවලින් යුක්තව කටයුතු කළ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මෙරට ඉතිහාසය තුළ වසභ රජුට හිමිවන වැදගත්කම කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් වැව් නිර්මාණය කරවූ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. මින්නේරි වැව B. කලා වැව C. පදවිය වැව (ලකුණු 03)

(ii) a. මහ වැව් ඉදිකිරීමට බලපෑ අරමුණු දෙකක් හා

b. මහ වැව් ඉදිකිරීමේ දී අවධානය යොමුකළ ප්‍රධාන කරුණු දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අතීතයේ ජල කළමනාකරණයේ පැවති විශිෂ්ඨත්වය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඉතා පුරාණ කාලයේ සිට අපේ රටේ යකඩ නිස්සාරණ තාක්ෂණය පිළිබඳ පැවති දැනුම කරුණු තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) දෙවන නාගරීකරණයත් සමඟ මලය රටේ බිහිවූ රාජධානි දෙකක් හා කැලණි ගංගා මිටියාවතේ බිහිවූ රාජධානියක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත ABCD යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පුද්ගලයින් නම් කරන්න.

A. ගෝවින්ද මලය කඳු මුදුනෙහි බල කොටුවක් තනා ගැනීම

B. දඹදෙණියේ විජයසුන්දරාරාමය තැනවීම

C. කෝට්ටේ යුගයේ දී යාපනය ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යයට යටත් කර ගැනීම

D. ඇම්බැක්කේ දේවාලය කරවූ රජතුමා (ලකුණු 04)

(iii) තෙත් කලාපීය ප්‍රදේශවල ආර්ථික රටාවේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) නිරිත දිග රාජධානි සමයේ පැවති අධ්‍යාපනික හා සාහිත්‍ය දියුණුව කරුණු තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ නම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) පහත ABCD යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පුද්ගලයින් / ප්‍රදේශ නම් කරන්න.

A - මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා

B - කීර්ති ශ්‍රී රාජසිංහ රජු සංඝරාජ තනතුර පිරිනැමූ භික්ෂූන් වහන්සේ

C - ක්‍රි. ව. 1630 පෘතුගීසීන් සමූල ඝාතනය කළ සටන සිදුවූ ප්‍රදේශය

D - ඉංග්‍රීසීන් විසින් ශ්‍රී වික්‍රමරාජසිංහ රජු පිටුවහල් කළ ප්‍රදේශය (ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ පැවති අධිකරණ කටයුතුවල ස්වභාවය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානි සමයේ පැවති ආර්ථික හා සමාජ කටයුතු කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් ලංකාව බෙදූ පළාත් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) 1910 ඉදිරිපත් කළ මැකලම් ප්‍රතිසංස්කරණ යෝජනාවල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ලංකාවේ ආර්ථිකය වෙනස් කිරීම සඳහා කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ඉවහල් වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් ඉදිරිපත් කරන ලද විධායක කාරක සභා ලංකාවේ ඉදිරි සංවර්ධනයට ඉවහල් වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) පහත සඳහන් දේශපාලන පක්ෂවල නායකයින් නම් කරන්න.

A - ෆෙඩරල් පක්ෂය

B - එක්සත් ජාතික පක්ෂය

C - විප්ලවකාරී සම සමාජ පක්ෂය (ලකුණු 03)

(ii) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ අගමැති ධූර කාලයේ හඳුන්වා දුන් ප්‍රතිපත්ති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වියළි කලාපීය ප්‍රදේශවල ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධනය වෙනුවෙන් කටයුතු කර ඇති ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) ඇමරිකාවේ පිහිටවූ බ්‍රිතාන්‍ය ජනපද තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දැක්වෙන ප්‍රකාශනවලට අදාළ තොරතුරු සපයන්න.

A - ඇමරිකානු නිදහස් සටනේ සටන් පාඨය

B - ඇමරිකානු ජනපදවලට නව බදු පැනවූ අගමැතිවරයා

C - බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකාව ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගත් ගිවිසුම

D - නිදහස් ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍ය ජාතිකයන් ඇමරිකාවේ ජනපද පිහිටුවීමට හේතුවූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න. (ලකුණු 06)


(09) (i) පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධ වූ මිත්‍රපිලේ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමුවන ලෝක යුද්ධයට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය ආරක්ෂා කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා

